**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අවතාරයක් පාලක ප්‍රභූව හමුවේ හොල්මං කරයි

## A specter haunts the ruling elite

**2009 මාර්තු 9**

සමාජවාදයේ අවතාරය ඇමරිකානු පාලක ප්‍රභූව හමුවේ හොල්මං කරයි.

සමාජවාදය පිලිබඳ අපේක්ෂාවන්ට වඩවඩා කෙරෙන සැඳහුම් මාධ්‍ය තුල දක්නට ලැබේ. ධනේශ්වරයේ විවිධ කන්ඩායම් සමාජවාදී ප්‍රවනතා ගැන එකිනෙකාට චෝදනා එල්ල කර ගන්නේ, නිදහස් ව්‍යවසායේ මූලධර්මවලට ස්වකීය පරම කැපවීම අවධාරනය කරන ගමන්ය.

ඊයේ ඉරිදා මාධ්‍ය සාකච්ඡා මන්ඩපවල සාකච්ඡාවට ලක්වුනු කේන්ද්‍රීය මාතෘකාවලින් එකක් වූයේ ඔබාමාගේ පිලිවෙත් යම් ආකාරයකින් සමාජවාදී බවට රිපබ්ලිකන්වරු කරන චෝදනාය. ඒබීසී ප්‍රවෘත්ති සේවයේ “ජෝර්ජ් ස්ටීපනොපොලොස් සමග මේ සතිය” නම් වැඩසටහනට එක්වූ නිත්‍ය තීරුලිපි රචකයන්ගේ මන්ඩලය -- ඊ.ජේ. ඩියොන්, ඩේවිඩ් බෘක්ස්, ජෝර්ජ් විල් සහ කුකී රොබර්ට්ස් -- එම කාරනය විවාදයට ලක් කලේය.

එන්බීසී සේවයේ “මාධ්‍ය හමුව” වැඩසටහනේ දී, ඩිමොක්‍රැටික් සෙනෙට් සභික චාල්ස් ස්චුමර් සහ රිපබ්ලිකන් සෙනෙට් සභික ලින්ඩ්සේ ග්‍රැහම්, බැංකු ආන්ඩුවට පවරාගැනීමේ හැකියාව ගැන සාකච්ඡා කලහ. ස්චුමර් සහ ග්‍රැහම් යන දෙදෙනාම යම් ආකාරයක ජනසතුකරනයකට සහයෝගය දුන්හ. කෙසේවෙතත්, ඔවුන් දෙදෙනාම, ආන්ඩුව සත්‍ය වසයෙන් ම බැංකු පුද්ගලික අයිතිකරුවන්ගෙන් තමන් අතට පවරා ගන්නා “නරක ජනසතුකරනය” සහ ඔවුන් “භාරකාරත්වය” ලෙස වඩා හොඳින් හඳුන්වන “හොඳ ජනසතුකරනය” අතර වෙනස දැක්වීමට හදිසි වූහ. මෙම “භාරකාරත්වය” යන්නෙහි දී ආන්ඩුව බැංකුවල ශේෂ පත්‍ර පියවා ඒවා ඉක්මනින් ම පුද්ගලික ආයෝජකයන්ට විකුනා දමනු ඇත.

සමාජවාදයට කෙරෙන විවිධ සැඳහුම්වලින් බොහෝ විට වඩාත්ම අත්‍යසමාන සැඳහුම කලේ ජනාධිපති බරක් ඔබාමා ම ය. සිකුරාදා *නිව් යෝර්ක ටයිම්ස්* පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී, ඔහු සමාජවාදියකු ලෙස රිපබ්ලිකන් පක්ෂයේ කොටස් වෙතින් එල්ල වන චෝදනාවලට දක්වන ප්‍රතිචාරය කුමක්දැයි ඔබාමාගෙන් අසන ලදි. ඔබාමා ප්‍රශ්නයෙන් විශ්මයට පත්වූ නමුත් එයට සිනහ පහල කල ඔහු සරලවම මෙසේ ප්‍රතිචාර දැක්වීය: “පිලිතුර නම් නැත යන්නයි.”

සම්මුඛ සාකච්ඡාවෙන් පසුව, ඔබාමා සහ ඔහුගේ උපදේශකයන් ඒ ගැන සාකච්ඡා කල බවක් පෙනී ගියේය. මිනිත්තු 90කට පසුව ජනාධිපති *ටයිම්ස්* වාර්තාකරු ජෙෆ් සෙලනිව යලි කැඳවීමේ අසාමාන්‍ය පියවරක් ගත්තේය. ප්‍රශ්නයේ ඇගවුම් පිලිබඳව පැහැදිලිවම නොසන්සුන්ව සිටි ඔබාමා සමාජවාදයට එරෙහි සිය විරුද්ධත්වය විස්තාරනය කොට චෝදනාව අනෙක් පාර්ශ්වය දෙසට හැරවීමට උත්සාහ කලේය. “මං හිතන්නේ, මිනිස්සු ඔය වචන දමලා ගහනවා ඇහෙන කොට, සටහන් කරගැනීමට වැදගත් කාරනාව නම්, අපි ඇත්ත වසයෙන්ම ක්‍රියාත්මක වෙලා තියෙන්නෙ නිදහස් වෙලඳ පොල මූලධර්ම සමග මුලුමනින්ම ගැලපෙන ආකාරයකටයි කියන එකයි, සමාජවාදය කියන වචනයෙන් දමලා ගහන ඔය මිනිස්සුන්ගෙන් සමහරුන්ට එහෙම කියන්න බැහැ කියන එකයි.” යයි ඔහු පැවසීය.

සමාජ අසහනය පිලිබඳ අපේක්ෂාවන් ද මාධ්‍ය තුල නිරන්තරයෙන් සාකච්ඡාවට ලක්වන මාතෘකාවක් බවට පත්ව ඇත. ඉරිදා *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ, “අවමුඛ යුරෝපය” යන මැනේ ලික්වාට් අහමඩ් විසින් ලියන ලද අටුවා ලිපියක්, යුරෝපයේ ආර්ථික කඩාවැටීමට සැඳහුම් කලේය. ඔහු එය 1931 දී ක්‍රෙඩිටන්ස්ටෝල්ට් නම් ඔස්ට්‍රියානු බැංකුව කඩාවැටීමට සන්සන්දනය කලේය. එම සිද්ධිය යුරෝපයේ මූල්‍ය කලබැගෑනියක් අවුලුවාලූයේ මහා අවපාතයට මාවත සකසමිනි.

නැගෙනහිර යුරෝපයේ ආර්ථික දියවීම “සමාජ අසහනය ප්‍රකුපිත” කරන බව අහමඩ් ලිවීය. එක්සත් ජනපදය සඳහා පවතින ඇගවුම් ගැන අනතුරු අගවමින් ඔහු මෙසේ සටහන් කලේය: “සිය නිවාස අහිමිවීමට ලක්වූ ඇමරිකානු අවමුඛ උගස් නයගැතියන් -- අඩු ගනනේ මේ වන තෙක් -- වීදිවල කැරලි ගසන්නේ නැත. නැගෙනහිර යුරෝපයේ කම්කරුවෝ එසේ කරති.”

*ටයිම්ස්* පත්‍රයේ එම පිටුවේ ම පලවූ වෙනත් අදහස් දැක්වීමක දී, ෆ්‍රෙඩ්රික් මෝර්ටන් 1913 දී ඔස්ට්‍රියාව සමග අද තතු සන්සන්දනය කලේය. ඔහු සිය ලිපිය

සමාප්ත කලේ, "එලිදරව්වේ විද්‍යාගාරය" ලෙස ඔස්ට්‍රියාව නම් කල කාල් ක්‍රව්ස්ගේ උපුටා දැක්වීමකිනි. මොර්ටන් මෙසේ විමසීයඃ "අද ඇමරිකාව ගැන ඔහු කුමක් කියනු ඇතිද?"

ජිමී කාටර්ගේ හිටපු ජාතික ආරක්ෂක උපදේශක ස්බිග්නීව් බ්‍රෙසෙසින්සිකි, එම්එස්එන්බීසී සේවයේ මෑත දී පෙනී සිටිමින්, "පන්ති ගැටුම" යලි මතුවීම ගැන කනස්සල්ල පල කලේය.

සමාජවාදය පිලිබඳ මෙම සාකච්ඡාවෙහි නිමග්න වන්නේ, දශක ගනනාවක් තිස්සේ තථ්‍ය සමාන රාජ්‍ය ආගමක් ලෙස ප්‍රති-කොමියුනිස්ට්වාදය හා ප්‍රති-සමාජවාදය ප්‍රවර්ධනය කර ඇති දේශපාලන හා මාධ්‍ය ප්‍රභූවක් ය යන්න උත්ප්‍රාසජනක ය. දේශපාලන සංස්ථාපිතයේ එකඳු කන්ඩායමක් වත්, ධනවාදයට හෝ මූල්‍ය ප්‍රභූවේ අවශ්‍යතාවන්ට මොනම ආකාරයකින් හෝ අභියෝග කරන පිලිවෙතක් ඉදිරිපත් කරන්නේ නැත. තවමත් කම්කරු පන්තියේ මහජන සමාජවාදී ව්‍යාපාරයක් ද නැත.

කෙසේවෙතත්, ධනවාදයේ අර්බුදයේ ඇගවුම් ද පාලක පන්තියේ පිලිවෙත්වලට එරෙහිව මහජන සමාජ විරුද්ධත්වයක් පැනනැගීමේ හැකියාව ද ගැන මෙම ස්ථර තුල වැඩෙන නොසන්සුන්භාවයක් පවතී. මේ වන තෙක්, එක්සත් ජනපදය තුල දේශපාලන සාකච්ඡාව ආන්තිකව පටු රාමුවකට සීමා වී පැවත ඇත. මාධ්‍ය තුල හා සාකච්ඡා මන්ඩපවල මතු කෙරෙන මතවල විවිධත්වය, ජනගහනයේ ධනවත්ම දාහෙන් පංගුව තුල පවතින මතවල විවිධ පැති අඩංගු කරගනී.

එහෙත් වර්ධනයන්ට වෛෂයික තර්කනයක් පවතී. එක්තරා අවස්ථාවක දී, ප්‍රමාද දී නොව ඉක්මනින් ම, පිලිවෙත් පිලිබඳ සාකච්ඡාව ඒවායේ දෘඩ ග්‍රහනයෙන් මිදී යනු ඇත. ගෝලීය අවපාතයෙන් සෘජුවම බලපෑමට ලක්වන මහජනතාවෝ එයට සහභාගි වනු ඇත.

මුදාහැරිය හොත්, මූල්‍ය ප්‍රභූවේ ධන සම්පත්වලට හා වරප්‍රසාදවලට එරෙහිව එල්ල කෙරෙන ධනවාදයට එරෙහි මහජන විරුද්ධත්වයක රූපාකාරය ගන්නා වූ, අතිමහත් වෛරයක් ගොඩනැගීම පිලිබඳව පාලක පන්තිය තුලම සංවේදනයක් පවතී. එවිට සමාජවාදය, හුදු අවතාරයක් ලෙස නොව, දශ ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ විඥානය තුලට කාවැදුනු ජීවමාන දේශපාලන ව්‍යාපාරයක් ලෙස, වර්ධනය වනු ඇත යන්න පිලිබඳව ඔවුහු කන්ස්සල්ලට පත්ව සිටිති. ඔවුන් එසේ කනස්සල්ලට පත්වීම නිවැරදිය.

**ජෝශප් කිෂෝර්**

© www.wsws.org